# සාමාන්‍ය සමයේ දස නවවන සතිය
# සෙනසුරාදා

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 19: 13–15

**“ළඳරුවන්ට මා වෙත එන්නට ඉඩ හරින්න. ස්වර්ග රාජ්‍යය මෙවැන්නන්ගේ ය. ”**

එකල ජේසුස් වහන්සේගේ අත් ළදරුවන් පිට තබා යාච්ඤා කරන පිණිස සමහරු උන්වහන්සේ වෙතට ඔවුන් ගෙනා හ. ශ්‍රාවකයෝ ඔවුන්ට තරවටු කළහ. එහෙත් ජේසුස් වහන්සේ කතා කොට, “ළදරුවන්ට මා වෙත එන්න ඉඩ හරින්න. ඔවුන් නොවළක්වන්න. මන්ද ස්වර්ගය රාජ්‍යය මෙවැන්නන්ගේ ය”යි වදාළ සේක. උන්වහන්සේ ඔවුන් පිට අත් තබා එතැනින් නික්ම ගිය සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.